# 2021

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# Annual Report



## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

## விஜய குமரதுங்க நினைவு மருத்துவமனை

## Wijaya Kumaratunga Memorial Hospital

# වාර්ෂික වාර්තාව- සිංහල

# 2021

# පටුන


| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ ඓතිහාසික පසුබිම | 03-04 |
| ආයතනික තොරතුරු | 05-06 |
| ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන සභාපතිනියගේ ලිපිය | 07 |
| කාර්ය මණ්ඩල වාර්තාව | 08 |
| රෝහල් සේවා විශ්ලේෂණය | 09-16 |
| 2021 වසරේ හා සපුරාගත් ඉලක්ක හා ප්‍රධාන පරිත්‍යාග | 17 |
| 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ඇතුලු මූල්‍ය ප්‍රකාශ | 18-31 |
| 2021 දෙසැම්බර් 31 දිනින් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව ( 2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව ) | 32-37 |


## දැක්ම

අනගිතම සෞඛ්‍යාරක්ෂාවක් හා ආදර්ශ රෝහලක ආදර්ශය සැපයීම.

## මෙහෙවර

ප්‍රදේශයේ හා රටේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා පහසුකම් හා සේවක මඩුල්ල ඇපකැපව හා කාර්යක්ෂමව භාවිතා කිරීම. කායික රෝග, ශල්‍ය රෝග , අක්ෂි රෝග, දියවැඩියාව හා තුවාල සුව කිරීම යන ක්ෂේත්‍ර වල රාජ්‍ය තලයේ සෞඛ්‍ය තත්වයක් සැපයීම පිණිස රෝහලේ දැනට ඇති පහසුකම් දිගුකාලීනව වැඩිදියුණු කිරීම

## සාමූහික අභිමතාර්තයන්

රෝහලේ අරමුණ වන්නේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන පොදු ජනයාට කිසිදු පංති භේදයකින් තොරව අක්ෂි ප්‍රතිකාර, ශල්‍යමය හා දියවැඩියා කළමනාකරණය උසස් අන්දමින් සිදු කරමින් කාර්යක්ෂම සෞඛ්‍ය සේවා සැපයීම.

# විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ 2021 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා

## ඓතිහාසික පසුබිම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන ආරෝග්‍යශාලා මණ්ඩල ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග අනුස්මරන රෝහල 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කළ විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස පිහිටුවිනි. එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ මුල් ගම වන සීදූව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රෝහලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය දියත් කෙරිනි.

මෙම රෝහල ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක-සීදූව නගර සභා සීමාව තුල කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයේ සීදූවේ පිහිටි අක්කර තුනක ඉඩමක් විජය කුමාරතුංග අනුස්මරන පදනම මගින් ඉදි කෙරිනි. ආරම්භයේ දී රෝහල වාට්ටු දෙකක් (ඇඳන් 60) ක් හා බාහිර රෝගී අංශයක් සහිත වූ අතර සීදූවේ ජනයාට විශේෂයෙන්ම මූලික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් බවට පත් විය. එවකට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විජය කුමාරතුංග මහතාගේ උපන් දිනය වන 1999 ඔක්තෝබර් 09 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී. රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර, අරමුදලේ ප්‍රධාන අරමුදල් ප්‍රවාහය සිදු කරනුයේ රජය මගිනි. අද වන විට රෝහල මගින් වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි ප්‍රතිකාර සේවා මෙන්ම වෙනත් තෘතීමය ප්‍රතිකාර ලබා දෙමින් විශාල ජනතාවකට සේවය සළසයි.

විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති තීරණ ගනු ලබන අතර එහි මෙහෙයුම් හා එදිනෙදා කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 නොවැම්බර් 12 වන දින පලකළ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග අනුස්මරන ආරෝග්‍යශාලා මණ්ඩල පනත ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පනතක් මගින් සිදු කෙරේ. විජය කුමාරතුංග අනුස්මරන රෝහල ප්‍රතිපත්තියක් ලෙස ලාභ තකා පිහිටවූ එකක් නොවනවා වුවද ඊට ආවේනික ගාස්තු ක්‍රමයක් ඇත. මෙහිදී ශල්‍යකර්ම සහ වැඩිදුර පරීක්ෂණ වැනි තෝරාගත් ක්ෂේත්‍ර තුල අයකිරීම් සිදු කරනුයේ පිරිවැය ආවරනය කර ගැනීම සඳහා පමණි. එසේ වුවද, අඩු ආදායම්ලාභී ජනයාගෙන් මෙම සාධාරණ අයකිරීම් වුවද අය නොකෙරේ.

වැඩිදියුණු කිරීම් වල කොටසක් ලෙස ඇඳන් 88 කින් සමන්විත අක්ෂි වාට්ටුවක් සහිත වෙනම ගොඩනැගිල්ලක් තැනීම 2004 දී දියත් කර ඇත. ජනයාට උසස් ප්‍රමිතියකින් යුතු සේවාවක් ලබා දීමේ අරමුණින් පවත්නා ප්‍රමිතීන් වැඩිදියුණු කර ශල්‍යාගාරයක් සහිතව පූර්ණ පහසුකම් වලින් යුතු අක්ෂි වාට්ටුවක් 2007 වසරේ දී අරඹන ලද අතර 2007 දී සමස්ථ ඇඳන් ප්‍රමාණය 148 ක් බවට පත් විය.

2012 වසරේ දී දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අවසන් කර ඇති අතර එය වර්තමානයේ සාමාන්‍ය ගබඩා, රාජකාරී කාමර විවේක කාමර හා දේශන ශාලාවක් වැනි අංග වලින් සමන්විත වේ.

2015 වසරේ දි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) උපදෙස් මත රු. මිලියන 12.431 ක වියදමක් සහිතව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවසන් කර ගැනීමට හැකි වී ඇති අතර එය රසායනාගාර ගොඩනැගිල්ල ලෙස නම් කර ඇත. වර්තමානයේ එතුල රසායනාගාරය, වෛද්‍ය ලේඛණාගාරය, අභ්‍යන්තර විගණන ඒකකය , පවුල් වෛද්‍ය සායනය , උපයෝගීතා කාමර ස්ථාපිත කර ඇත.

2016 වසර තුල ශල්‍ය ඒකකය පිහිටුවනු ලැබූ අතර ශල්‍ය වාට්ටුව රසායනාගාර ගොඩනැගිල්ලේ බිම් මහලේ ආරම්භ විනි. එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම මගින් ශල්‍ය ඒකකයේ 2016 වසර තුල රෝගී ප්‍රතිකාර සේවාලබා දීම පුළුල් කෙරිනි.

2017 දී ශල්‍ය වාට්ටුව අක්ෂි ගොඩනැගිල්ලට වෙත මාරු කරන ලද අතර 2017 නොවැම්බර් මාසයේදී බාහිර රසායනාගාරය නව රසායනාගාර ගොඩනැගිල්ල තුල ස්ථාපිත කෙරිනි.යෝජිත වාට්ටු සංකීර්ණ ව්‍යාපෘතියේ ගොඩනැගිලි සැලසුම 2017 අග භාගයේ දී විශ්ලේෂණය කෙරිණ.

2019 වසරේදී යෝජිත වාට්ටු සංකීර්ණය ඉදි කිරීම සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලදී.නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ඉහත යෝජිත වාට්ටු සංකීර්ණ ගොඩනැගිල්ල ඉදි කිරීම් කටයුතු ආරම්භ නොවිනි.

ප්‍රධාන ව්‍යාපෘති වශයෙන් වසර කීපයක සිට අවශ්‍යතාවයක්ව පැවති ශල්‍යාගාර අලුත්වැඩියාව සහ වෛද්‍යවරුන්ගේ විවේකාගාරයක් ඉදි කිරීම 2019 වසරේදී සිදු කර ගැනීමට හැකිවිනි.

ප්‍රධාන ව්‍යාපෘති ලෙස අක්ෂි ගොඩනැගිල්ලට අයත් අක්ෂි හා ශල්‍ය වාට්ටු , අක්ෂි සායන නවීකරණ කටයුතු 2020 වසරේදී සිදු කර ඇත.

2020 හා 2021 දී වසරේදී ව්‍යාප්ත වු කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රෝහල් සේවාවට බාධා ඇති වුවද , ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුකූලව රෝගී සත්කාර සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.

පවුල් වෛද්‍ය සායනය අලුත්වැඩියා කිරීම 2021 වසරේදී සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘතියකි.දැනට පැවති ඒක්ස් රේ යන්ත්‍රය වසර 21 ක් පැරණි බැවින් ජීව විද්‍යා ඉංජිනේරු අංශයෙන් පරිත්‍යාග ලෙස නව යන්ත්‍රයක් ලබා ගැනීමට වත්මන් අධ්‍යක්ෂ වෛද්‍ය රෝයි පෙරේරා මහතා සමත් විනි.

2021 වසරේදී රුපියල් මිලියන 19.32 ක් වටිනා නවීන ඔපරේටින් මයික්‍රොස්කොප් යන්ත්‍රයක් අක්ෂි ශල්‍යාගාරය වෙත ලබා ගැනීමට හැකි විනි.

වර්තමානයේ වාට්ටු 5 ක් සහ ඇඳන් 137 ක් ඇත . (2021 )

## ආයතනික තොරතුරු
## 01-01-2021 ~ 31-12-2021

### ආයතනයේ නම

විජය කුමාරතුංග අනුස්මරන රෝහල

### ලිපිනය

විජය කුමාරතුංග අනුස්මරන රෝහල, සීදූව

### කළමනාකාරිත්වය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්

### නෛතික ව්‍යුහය

1999 අංක 38 දරණ පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇත.

### විගනකවරු

- විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, 306 /72 , පොල්දූව පාර , බත්තරමුල්ල
- අභ්‍යන්තර විගණන අංශය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය,
  අංක 26, ශ්‍රී සංඝරාජ මාවත , කොළඹ 10

## අධ්‍යක්ෂ මණ්ඩලය
## 01-01-2021 ~ 31-12-2021

**සභාපතිනි**

- හිටපු ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

**අධ්‍යක්ෂ මණ්ඩලය**

- වෛද්‍ය අසේල ගුණවර්ධන, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
- එන්.ඒ. උමගිලිය මයා
- වයි.සුමනා යාපා මිය- භාණ්ඩාගාර නියෝජිත
- ආනන්ද විමලසේන මයා
- රවින්ද්‍ර ඒකනායක මයා

## විගණන කමිටුව

**01-01-2021 ~ 31-12-2021**

### සභාපති

වයි.සුමනා යාපා මිය, අධ්‍යක්ෂ , ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය

### නිරීක්ෂක

ආර්.ජී.ඩී ප්‍රියදර්ශනී මිය , ප්‍රධාන අභ්‍යන්තර විගණක , සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය,
අයි.අබේගුණවර්ධන මිය , විගණන අධිකාරි , ජාතික විගණන කාර්යාලය , බත්තරමුල්ල

### සාමාජික

වෛද්‍ය යූ.එල්.ආර්.එම්. පෙරේරා මහතා, අධ්‍යක්ෂ ,විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

<u>සහභාගිත්වය</u>
වෛද්‍ය ඩී.ජී.ජී.රණවීර, ප්‍රධාන වෛද්‍ය නිලධාරී, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
පී ඒ එම් පී එන් පෙරේරා , අභ්‍යන්තර විගණක ,විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
පී.ඩී.ටී.පී.එන්.බර්නාඩ් -ගණකාධිකාරී විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
ආර් ජී ජී එස් කේ රණසිංහ , පරිපාලන නිලධාරී , විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

### බැංකුකරුවෝ

ලංකා බැංකුව, සීදූව

# සභාපතිවරිය විසින් වාර්ෂික වාර්තාව යොමු කිරීමේ ලිපිය

ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
385, බද්දේගම විමලවංශ නාහිමි මාවත
"සුවසිරිපාය",
කොළඹ 10.

**<u>2021 වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව</u>**

1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) වගන්තිය අනුව, විජය කුමාරතුංග අනුස්මරන රෝහලේ පාලක මණ්ඩලය වෙනුවෙන් මම 2021 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ විජය කුමාරතුංග අනුස්මරන රෝහල් පාලක මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශය හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ස්තූතියි.

මෙයට විශ්වාසී,

චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග
සභාපතිනි
විජය කුමාරතුංග අනුස්මරන රෝහල,
සීදූව.

පිටපත : ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

## 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

| තනතුර | කාර්ය මණ්ඩලය | කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ | 1 | 1 |
| නිර් වින්දන විශේෂඥ වෛද්‍ය | 1 | 1 |
| කායික රෝග විශේෂඥ වෛද්‍ය | 2 | 1- ස්ථිර<br>1-අමාත්‍යාංශ අනුයුක්ත කිරීම් |
| ශල්‍ය වෛද්‍ය විශේෂඥ | 1 | 1 |
| අන්තරාසර්ග විශේෂඥ වෛද්‍ය | 1 | 0 |
| අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය | 2 | 1 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරි | 1 | 1 |
| වෛද්‍ය නිලධාරි | 28 | 19 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 2 | 0 |
| අභ්‍යන්තර විගණක | 1 | 1 |
| ගණකාධිකාරී | 1 | 1 |
| ලියාපදිංචි වෛද්‍ය නිලධාරි | 2 | 3 |
| විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී | 1 | 1 |
| හෙද සොයුරිය | 3 | 0 |
| හෙද නිලධාරි | 85 | 82 |
| පරිපාලන නිලධාරි | 1 | 1 |
| ඖෂධවේදී | 6 | 6 |
| විකිරණශිල්පී | 2 | 1 |
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 5 | 5 |
| අක්ෂි තාක්ෂණවේදී | 4 | 3 |
| පෝෂණවේදී | 1 | 0 |
| වැඩ මූලික | 1 | 0 |
| වායු සමීකරණ කාර්මික ශිල්පී | 1 | 0 |
| විද්‍යුත් යන්ත්‍ර රේඛණ ශිල්පී | 2 | 1 |
| කළමණාකරණ සහකාර | 11 | 10 |
| ඖෂධ සංයෝජක | 3 | 2 |
| ආහාර නිරීක්ෂිකා | 1 | 1 |
| නිවාස භාරකාරිනී | 1 | 0 |
| වෛද්‍ය ලේඛණාගාර සහකාර | 1 | 1 |
| වාට්ටු ලිපිකරු | 1 | 1 |
| රියදුරු | 5 | 5 |
| විදුලි කාර්මික | 1 | 1 |
| නඩත්තු කම්කරු | 3 | 3 |
| ලැබ් ඕඩර්ලි | 2 | 2 |
| අරක්කැමි | 3 | 2 |
| දුකරථන ක්‍රියාකරු/පිලිගැනීමේ නිලධාරී | 3 | 1 |
| සෞඛ්‍ය කාර්ය සහයක | 69 | 67 |
| **එකතුව** | **259** | **227** |

# රෝහල මගින් ලබා දෙන  සේවා

## හැඳින්වීම

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මගින් බාහිර ප්‍රතිකාර සේවා හා අභ්‍යන්තර ප්‍රතිකාර සේවා යන දෙවර්ගයම ලබා දේ.  බාහිර රෝගී අංශය (OPD), ප්‍රාථමික සත්කාර ඒකකය (PCU), එන්ඩොස්කොපි ඒකකය හා විශේෂිත සායන මගින් බාහිර ප්‍රතිකාර සේවා සළසා දේ. කායික වෛද්‍ය වාට්ටු, ශල්‍ය වාට්ටු, අක්ෂි වාට්ටු, තුවාල සත්කාරක වාට්ටුව හා ශල්‍යාගාර මගින් අභ්‍යන්තර සේවා සළසා දේ.
2021 වසරේ වාට්ටුගතව ප්‍රතිකාර ලබා ගත් ප්‍රතිශතය 70.29% ක් විය.

2021 වසරේදී මුලු රෝගී වාට්ටුගත ඇතුලත්වීම් 9,669 ක් විය.

රෝගී ප්‍රතිකාර සේවා සඳහා රෝහලේ පිහිටි ඩිස්පෙන්සරිය, එක්ස් කිරණ ඒකකය, වෛද්‍ය රසායනාගාරය හා ඊසීජී ඒකකය ඉවහල් වේ. විශේෂිත නොවන මෙන්ම විශේෂිත සේවා රෝහල මගින් මහජනයාට ලබා දේ. මෙම රෝහල ඒ වර්ගයේ ප්‍රාදේශීය රෝහලක් ලෙස  සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2020 වසරේදී  වර්ග කර ඇත.

අභ්‍යන්තර කළමණාකරනය අවශ්‍ය වන වෛද්‍ය, ශල්‍ය හා  අක්ෂිමය සංකූලතා වලින් පෙලෙන රෝගින් බාහිර රෝගි අංශය, ප්‍රාථමික සත්කාර  ඒකකය හා විශේෂිත සායන වලින් වාට්ටු වලට ඇතුළත් කෙරේ.  MRI, CT ස්කෑන් වැනි විශේෂ පරික්ෂණ අවශ්‍යවන රෝගින්ව ජාතික රෝහල, රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල  වැනි රෝහල් වලට යොමු කෙරේ.

2021 දී රෝහල් ගාස්තු වැඩි කිරීමත් , කාචය රෝගීයා විසින්ම මිලදී ගැනීමට ගත් තීරණයත් නිසා රජයට දැරිය යුතු මූල්‍ය බර අඩු කර ගැනීමට හැකි විනි.
මෙම  වසරේදී ෙකාවිඩ් 19 වසංගතෙයන් කාර්ය මණ්ඩලය හා රෝගීන්  අාරක්ෂා කර ගැනීමට පියවර ෙගන ඇත.2021 වසර තුල ඒන්නත් වැඩසටහන් පවත්වා ඇති  අතර මහජනතාව සඳහා කොවිඩ්   ඒන්නත් 11,386 ක් ලබා දී ඇත. සියලුම  කාර්ය  මණ්ඩල  සාමාජිකයින්ට ෆයිසර් බූස්ටර්  මාත්‍රාව  ඇතුලුව ඒන්නත් 3 ක් ලබා දී ඇත.

## 1. <u>බාහිර රෝගී අංශය (OPD)</u>

රෝහලේ බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන්ගෙන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ සීදුව කොටුගොඩ,රද්ෙදාළුව ,කදාන, ජා ඇල හා කටුනායක වැනි ප්‍රදේශ වලිනි. කටුනායක අපනයන සැකසුම් කලාපයේ කාර්ය මණ්ඩල ද ඒ අතර වේ. ඊට අමතරව,මිනුවන්ගොඩ හා ගම්පහ ප්‍රදේශ වලින්ද ප්‍රතිකාර තකා රෝගීන් මෙම රෝහලට පැමිණේ.

ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර දිනපතා උදේ 8 සිට සවස 4 දක්වා බාහිර රෝගී අංශය ක්‍රියාත්මක වේ.එම නිවාඩු දින වල බාහිර රෝගී අංශය පෙ.ව. 8 සිට 10.30දක්වා ක්‍රියාත්මක වේ.බාහිර රෝගී අංශ රෝගීන්ට සියලුම ඖෂධ වර්ග රෝහල් ඩිස්පැන්සරියෙන් ලබා දේ.බාහිර රෝගී අංශයේ රෝගීන් සඳහා ඊ.සී.ජී හා එක්ස් රේ පහසුකම් සලසා ඇත.

සතියකට දින 2 ක් පවුල් වෛද්‍ය විශේෂඥවරයා රෝහලේ සේවය කරන අතර විශේෂඥ උපදෙස් අවශ්‍ය රෝගීන් බාහිර රෝගී අංශයෙන් පවුල් වෛද්‍ය විශේෂඥවරයා වෙත යොමු කෙරේ.එම රෝගීන්ට පවුල් වෛද්‍ය සායනයේදී ප්‍රතිකාර ලබා දේ.

අවශ්‍ය අවස්ථා වල බාහිර අංශ රෝගීන් වෛද්‍ය සායනයට , අන්තරාසර්ග රෝග සායනයට හා පවුල් වෛද්‍ය සායනය වෙත යොමු කෙරේ.
2021 වසර තුල බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර ලැබූ මුළු සංඛ්‍යාව 47,514 කි.

බාහිර රෝගී අංශය මගින් සැරහුම් යෙදීම් 6,395 ක් හා එන්නත් ලබා දීම් 1,126 ක් ද සිදු කර ඇත.

1 වගුව මගින් බාහිර රෝගී අංශයට සම්බන්ධ පසුගිය වසර 5 තුල තත්වය විදහා දැක්වේ.

## 2. ප්‍රාථමික සත්කාර ඒකකය (PCU)

පැය විසිහතර පුරා විවෘතව ඇති ප්‍රාථමික සත්කාර ඒකකය මගින් රෝහලට ගෙන එන හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් සියල්ලට සත්කාර සැලසේ. මාර්ග අනතුරු, කාර්මික අනතුරු හා අපනයන සැකසුම් කලාපයේ ඇති වන කර්මාන්තශාලා අනතුරු , පිහි ඇණුම් හා ගෘහස්ත හදිසි අනතුරු වලින් පීඩාවට ලක්වන්නන් හදිසි ප්‍රතිකාර ඒකකයට රැගෙන එනු ලැබේ. උග්‍ර හදිසි අවස්ථා ප්‍රාථමික සත්කාර ඒකකයේ කලමණාකරණය කරනු ලබන අතර වෛද්‍ය , ශල්‍ය සහ අක්ෂි වැඩිදුර කලමණාකරණය අවශ්‍ය රෝගීන් රෝහලේ අදාල වාට්ටු වලට ඇතුලත් කර ඇත. සිදු කරනු ලබන ප්‍රතිකාර වලට අමතරව විශේෂිත වෛද්‍ය සත්කාර අවශ්‍ය වන රෝගීන් විශේෂිත ප්‍රතිකාර සඳහා මීගමුව රෝහල , උතුරු කොළඹ ශික්ෂණ රෝහල ,ජාතික අක්ෂි රෝහල යන රෝහල් වෙත වෙතට මාරු කෙරේ.

ප්‍රාථමික සත්කාර ඒකකයෙන් 2021 වසර තුල ප්‍රතිකාර ගත් මුළු රෝගී සංඛ්‍යාව 11,256 ක් විය.ගත වූ වසර 5 ට අදාළව ප්‍රාථමික සත්කාර ඒකකයේ සංඛ්‍යා ලේඛන 1 වගුව තුල දක්වා ඇත

## 3. දන්ත ඒකකය

දන්ත ඒකකය සඳුදා සිට සෙනසුරාදා දක්වා රෝගීන් සඳහා විවෘතව තැබේ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සතියේ සෑම දිනකම ද , පාසැල් සිසුන් සඳහා සෙනසුරාදා දිනවල ප්‍රමුඛත්වය ලබා දේ.

සාමාන්‍ය දන්ත ප්‍රතිකාර, දත් ගැලවීම්, පිරවීම් ,දත් සුද්ද කිරීම , ළමා දන්ත ප්‍රතිකාර, සුළු සැත්කම් ප්‍රතිකාර සායනය තුලදී සිදු කෙරේ. මියුකොසිල් ඉවත් කිරීම, පළුදු වූ 3 වන මොලර් ඉවත් කිරීම සහ මාර්ග අනතුරු වලින් සිදු වූ දන්ත අබාධ ප්‍රතිකාර යන ප්‍රතිකාර සිදු කරන සුළු සැත්කම් අතර කිහිපයකි.

රටතුල කොවිඩ් වසංගතය ව්‍යාප්ත වී තිබියදීත් දන්ත සායනයට පැමිණි සියලු රෝගීන් සඳහා සේවය ලබා දී ඇත.ඒ වන විට අනෙකුත් රෝහල් දන්ත සායන බොහෝමයක් නිසි පරිදි ක්‍රියාත්මක නොවීය.

2021 වසර තුලදී දන්ත ඒකකයට පැමිණි සමස්ත රෝගී සංඛ්‍යාව 3,671 ක් විය. ගත වූ වසර 5 තුල දන්ත ඒකකයේ සංඛ්‍යාලේඛන 1 වගුව තුල දක්වා ඇත.

## 4. කායික වෛද්‍ය ඒකකය

කායික වෛද්‍ය ඒකකය වාට්ටු 2 කින් හා වෛද්‍ය සායනයකින් සමන්විත වේ. පිරිමි වාට්ටුවෙහි ඇඳන් **20** ක් ද ගැහැණු වාට්ටුවෙහි ඇඳන් **28** ක් ද ඇත. වෛද්‍ය සායනය සඳුදා සිට සෙනසුරාදා දක්වා පවත්වනු ලැබේ. දියවැඩියාව**,**අධි රුධිර පීඩනය , ඇදුම සහ වෙනත් කායික රෝග වැලඳී ඇති රෝගීන් හට මෙම සායනයේදී ප්‍රතිකාර ලබා දේ.සෙනසුරාදා දිනයේ අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරියක විසින් පවත්වනු ලබන අන්තරාසර්ග රෝග සායනයක් පැවැත්විනි.එය විශේෂිත දියවැඩියා සායනයක් ද වන අතර අඩු වයස් රෝගීන් ( පලමු වර්ගයේ දියවැඩියා) , තයිරොයිඩ් ඌනතා සහ අනෙකුත් අන්තරාසර්ග රෝග සඳහා ප්‍රතිකාර ලබා දී ඇත.

2021 වසර තුල වෛද්‍ය සායනයෙන් සේවා ලබාගත් මුළු රෝගී සංඛ්‍යාව 30,212 ක් විය. ගතවූ පස් වසර තුල වෛද්‍ය සායනය, වාට්ටු අංක 1 (පිරිමි වාට්ටුව ) හා 2 (ගැහැණු වාට්ටුව) ට සම්බන්ධ සංඛ්‍යාලේඛන 2 වන වගුව තුල දක්වා ඇත.

### වෙනත් විශේෂ සායනය

- පවුල් වෛද්‍ය සායනය

සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් පවුල් වෛද්‍ය විශේෂඥවරයෙකු මෙම රෝහලට අනුයුක්තව සිටීන අතර ඔහු විසින් මෙම සායනය පවත්වන ලදී. බාහිර රෝගී අංශය තුල විශේෂඥ සේවා සඳහා මෙම සායනය වෙත යොමු කිරීම් සිදු කර ඇත.

බාහිර සෞඛ්‍ය අධ්‍යාපන මාර්ගෝපදේශ වැඩසටහන් සහ රෝග නිවාරණ වැඩසටහන් මෙම සායනය තුලින් ක්‍රියාත්මක කර ඇත.

2021 වසරේ පවුල් වෛද්‍ය විශේෂඥ සායනය වෙත රෝගීන් 5,275 ක් පැමිණ ඇත.

- වෙනත් සායන ( බෝ නොවන රෝග සායනය ,සුවනාරි සායනය ,පවුල් සංවිධාන සායනය)

බෝ නොවන රෝග( NCD) සායනය , සුව නාරි හා පවුල් සංවිධාන සායනය සතිපතා ශ්‍රේනිගත වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කෙරිනි**.** මෙම සායන මගින් සැගවුනු රෝග පිලිබඳ සමාජ දැනුවත්භාවය වැඩි කරනු ලබන අතර දැනුවත් කිරීමේ වැඩසටහන් කාලානුරූපීව සංවිධානය කර ඇත.බෝ නොවන රෝග , සුවනාරි සහ පවුල් සංවිධාන සායන මගින් 2021 වසර තුලදී පිළිවෙලින් රෝගීන් 426 , 439 හා 16 දෙනෙකුට ප්‍රතිකාර ලබා දී ඇත**.**

ගත වූ වසර පහ තුල වෙනත් සායන වල දත්ත 3 වන වගුව තුල දැක්වේ.

- ජංගම සායන Visiting clinic

අන්තරාසර්ග රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු රෝහලේ නොමැති වුවද බාහිර විශේෂඥ වෛද්‍යවරියක විසින් අන්තරාසර්ග රෝග පිලිබඳ සායනයක් පවත්වන ලදී.

මීගමුව රෝහලේ මනෝවෛද්‍ය විශේෂඥවරයාගේ අධීක්ෂණය යටතේ එහි මනොචිකිත්සක ඒකකයේ පුහුණුව ලත් ජේ ෂ්ඨ වෛද්‍යවරයෙකු විසින් මනෝවෛද්‍ය සායනය පවත්වාගෙන යනු ලැබ්.

අන්තරාසර්ග සායනය සහ මනොවෛද්‍ය සායනය සතියකට වරක් ක්‍රියාතමක වන අතර අවට රෝහල් වලින් සහ සායන වලින් යොමු කරන රෝගීන්ට මෙහි ප්‍රතිකාර ලබා දෙන ලදී.

2021 වසර තුල අන්තරාසර්ග රෝග සායනය , මානසික රෝග සායනය ,දියවැඩියා හා අධික රුධිර පීඩන සායනය සඳහා මුළු රෝගී සංඛ්‍යාව පිළිවෙලින් 1659 , 1601 හා 2960 ක් විය.

ගත වූ වසර පහ තුල ජංගම සායන වල දත්ත 4 වන වගුව තුල දැක්වේ.

## 5. <u>ශල්‍ය ඒකකය</u>

ශල්‍ය ඒකකය 2016 මැද භාගයේ දී අලුතින් ස්ථාපිත කරන ලදී . එක් විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකුගෙන් සහ වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ශල්‍ය ඒකකය සමන්විත වේ. වර්තමානයේ ඇදන් 28 කින් යුතු වාට්ටුවක් මෙම ඒකකය සතු වේ.2016 අවසාන භාගයේදී ශල්‍ය ඒකකය වෙත නවීන එන්ඩොස්කොපි යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම සිදු විය.

ශල්‍යාගාර සංකීර්ණයේ සාමාන්‍ය ශල්‍යකර්ම සඳහා වෙනම ශල්‍යාගාරයක් ඇති අතර එය සතියේ බොහෝ දින වල ශල්‍ය ඒකකය මගින් භාවිත කර ඇත.

2021 වසර තුල ශල්‍ය ඒකකය මගින් ලබා දුන් සේවාවන් පහත පරිදි වේ.

| විස්තරය | මුලු සංඛ්‍යාව |
|---|---|
| 2021 වසරේ සායනික රෝගීන් සංඛ්‍යාව | 5241 |
| මුලු ශල්‍යකර්ම සංඛ්‍යාව | 767 |
| ප්‍රධාන ශල්‍යකර්ම සංඛ්‍යාව | 628 |
| සුලු ශල්‍යකර්ම සංඛ්‍යාව | 139 |
| ඩුප්ලෙක්ස් ස්කෑන් සංඛ්‍යාව | 490 |
| Sclerotherapy ක්‍රියා පටිපාටිය | 174 |
| පී ආර් පී එන්නත් ලබා දීම | 219 |
| එම් පී එන්නත් ලබා දීම | 91 |
| FNAC ක්‍රියා පටිපාටිය | 05 |
| මුලු එන්ඩොස්කොපි පරීක්ෂණ සංඛ්‍යාව | 566 |
| UGIE ක්‍රියා පටිපාටිය | 43 |
| LGIE ක්‍රියා පටිපාටිය | 174 |
| කොලනොස්කොපි සංඛ්‍යාව | 24 |
| Proctoscopy පටිපාටිය සහ Sclerotherapy එන්නත් සංඛ්‍යාව | 163 |
| බයොප්සි - UGIE සහ LGIE | 24 |

## <u>තුවාල සත්කාර සායනය හා වාට්ටුව</u>

විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයාගේ උපදේශනය යටතේ පාලනය වන මෙම අංශය ඇඳන් 21 කින් යුත් වාට්ටු ඒකකින් හා සායනයකින් සමන්විත විය.

දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් මෙම සායනය සඳහා රෝගීන් පැමිණෙන අතර නිදන්ගත තුවාල සඳහා වාට්ටුගත ප්‍රතිකාර මෙන්ම සායනික ප්‍රතිකාරද ලබා දුනි.සැම වසරකම තුවාල සත්කාර ඒකකයට සහ ශල්‍ය වෛද්‍ය ඒකකයට වැඩි මුදල් ප්‍රමාණයක් වැය කර ඇත.

2021 වසරේ තුවාල සත්කාර සායනය වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව 9,316 ක් විය.

ගත වූ වසර පහ තුල මේ පිලිබඳ දත්ත 5 වන වගුව තුල දැක්වේ.

## 6. <u>අක්ෂි ඒකකය</u>

විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයෙකු ,වැඩ බලන විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයෙකු හා වෛද්‍ය නිලධාරීන් 5 දෙනෙක් මෙම අංශයට අනුයුක්ත කර ඇත .


මෙම ඒකකය ට අක්ෂි සායනය, ඇඳන් 40 කින් යුත් අක්ෂි වාට්ටුව හා අක්ෂි ශල්‍යාගාරය ඇතුළත් වන අතර මෙම ඒකකය මගින් පහත සේවාවන් ලබා දී ඇත.

- අක්ෂි සැත්කම්
- අක්ෂි සායන
- පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාවන්
- අක්ෂි පරීක්ෂණ
- ලේසර් ප්‍රතිකාර

අක්ෂි ඒකකය මගින් අවට ප්‍රදේශයේ රෝගීන්ට පමණක් නොව දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර ලබාදේ.

- <u>අක්ෂි සැත්කම්</u>

ප්‍රධාන වශයෙන්ම ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සිදු කරනු ලබන අතර සිදු කරන ලද ශල්‍යකර්ම වර්ග පහත දැක්වේ.



2021 වසර තුල ප්‍රධාන අක්ෂි ශල්‍යකර්ම 5165 ක් හා සුලු ශල්‍යකර්ම 356 ක් සිදු කර ඇත.ඒ අනුව මුලු අක්ෂි ශල්‍යකර්ම සංඛ්‍යාව 5,521 ක් වේ.

- **<u>අක්ෂි සායන</u>**

දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විවිධ අක්ෂි ආබාධ සහිත රෝගීන් මෙම සායන වලට පැමිණ ඇත. medical retina, surgical retina, uveitis, variety of corneal diseases, strabismus, ocular tumours , oculoplasty and neuro-ophthalmic cases වැනි ගැටලු සහිත රෝගීන්ට මෙහිදී ප්‍රතිකාර සැලසේ. සියලු අක්ෂි හදිසි අනතුරු සඳහා දිනපතා අක්ෂි සායනයේදී ප්‍රතිකාර සැලසේ.

සාමාන්‍ය අක්ෂි සායනයට අමතරව අක්ෂි දියවැඩියා සායනය ග්ලූකෝමා සායනය මෙන්ම අක්ෂි ළමා සායනයද පැවැත්වේ.

2021 වසරේදී සාමාන්‍ය අක්ෂි සායන රෝගීන් 27,603 ක් සඳහා ප්‍රතිකාර සලසා ඇත.

- **<u>පැය 24 පුරා ක්‍රියාත්මක අනතුරු කලමණාරකණ සේවාව</u>**

දෛනික සායනික වේලාවෙන් පසු අක්ෂි වාට්ටුව වෙත පැමිණි අක්ෂි අනතුරු සහ හදිසි රෝගීන් 1,850 ක් සඳහා 2021 වසරේදී ප්‍රතිකාර ලබා දී ඇත.

- **<u>අක්ෂි පරීක්ෂණ</u>**

මෙම ඒකකය විවිධ අක්ෂි පරීක්ෂණ පහසුකම් වලින් සමන්විත වේ.

I. දෘෂ්ඨී විතාන පරීක්ෂණ- Spectral domain OCT machine, B scanner, FFA
II. ග්ලූකෝමා පරීක්ෂණ-, OCT- RNFL
III. Biometry පරීක්ෂණ - A and B ultrasound scanner, IOL master

2021 වසරේදී OCT පරීක්ෂණ 1573 ක් ද Biometry පරීක්ෂණ 5741ක් අක්ෂි අංශයේදී සිදු කර ඇත.

- **<u>ලේසර් ප්‍රතිකාර</u>**

ලේසර් පහසුකම භාවිතයෙන් දියවැඩියා රෙටිනෝපති කලමණාරකණය විශාල ප්‍රමාණයක් සිදු කරනු ලබන අතර දෘෂ්ඨී විතානයේ ශිරා අවහිරතා , දෘෂ්ඨී විතානයේ පර්යන්ත පරිහානිය ආදිය ඉවත් කර ඇත . PRP ලේසර් 678 ක්ද , FLT ලේසර් 117 ක්ද , YAG CAP ලේසර් 191 ක්ද , YAG PI ලේසර් 43 ක්ද , වෙනත් ලේසර් 43 ක්ද ඇතුලුව 2021 වසර තුල මුලු ලේසර් ප්‍රතිකාර 1072 ක් සිදු කර ඇත.

## <u>සහයක සේවා</u>

## <u>7. වෛද්‍ය රසායනාගාරය</u>

වෛද්‍ය රසායනාගාරය නවීන පහසුකම් වලින් යුත් උපකරණ වලින් සමන්විත වන අතර ලේ සාම්පල් ලබා ගැනීම විධිමත් කිරීම සඳහා වෙනම සාම්පල් කාමරයක් ස්ථාපිත කර ඇත. වෛද්‍ය රසායනාගාරය තුල වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයින් සිව්දෙනෙක් අනුයුක්තව ඇත. සඳුදා සිට සෙනසුරාදා දක්වා ද , මසකට එක් ඉරිදාවක්ද රසායනාගාරය ක්‍රියාත්මක වේ.

2021 වසරේ සිදු කල රසායනාගාර පරීක්ෂණ මුළු සංඛ්‍යාව 53,177 ක් විය.

## 8. ඊ.සී.ජී.අංශය

විද්‍යුත් බන්තු රේඛණ ශිල්පියෙකු විසින් මෙහෙයවන ඊසීජී (ECG) ඒකකය මගින් බාහිර රෝගීන්ට මෙන්ම නේවාසික රෝගීන්ට සේවාව සැපයේ. මෙම අංශය විවෘතව තබන කාලයෙන් පරිබාහිර කාලයේදී අත්‍යාවශ්‍ය රෝගීන්ගේ ඊ සී ජී ප්‍රාථමික සත්කාර ඒකකයෙන් සිදු කරනු ලැබේ.

2021 වසරේදී සිදු කල මුලු මුළු ඊසීජී පරීක්ෂණ සංඛ්‍යාව 3,869 ක් විය.

## 9. එක්ස් කිරණ අංශය

එක් විකිරණ ශිල්පියකුගෙන් සමන්විත එක්ස් කිරණ ඒකකය සියළු වර්ගවල ශාරීරික එක්ස් කිරණ ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් වලින් සමන්විතව ඇත.නවීන **CR** යන්ත්‍රය ස්ථාපිත කිරීමත් සමග හානිකර රසායන ද්‍රව්‍ය වලට නිරාවරණය වීම අඩු විය .

2021 වසර තුල ලබා ගත් එක්ස් කිරණ සංඛ්‍යාව **1,816** ක් විය.

ගතවූ පස් වසරේ සහායක සේවා පිළිබඳ සංඛ්‍යා ලේඛන 7 වන වගුව තුල දක්වා ඇත.

### රෝගී සේවාවන් සම්බන්ධ සංඛ්‍යාලේඛණ සාරාංශය

අංක 1 වගුව

| අංශය /වසර | ප්‍රතිකාර ලද රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| බාහිර රෝගී අංශය | 117,080 | 103,420 | 109,102 | 71,212 | 47,514 |
| VP Referral Clinic-OPD | - | - | - | - | 984 |
| ප්‍රාථමික සත්කාර ඒකකය | 23,054 | 21,718 | 22,435 | 15,134 | 11,256 |
| දන්ත ඒකකය | 7,556 | 8,756 | 6,711 | 4,757 | 3,671 |

කායික වෛද්‍ය ඒකකය

අංක 2 වගුව

| අංශය /වසර | සායනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| වෛද්‍ය සායනය-කායික වෛද්‍ය | 43,180 | 40,695 | 42,436 | 34,012 | 30,212 |

| අංශය /වසර | වාට්ටුගත රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| වෛද්‍ය වාට්ටු අංක 1 - පිරිමි | 1,434 | 1,509 | 1,140 | 731 | 619 |
| වෛද්‍ය වාට්ටු අංක 2 - ගැහැණු | 1,802 | 2,238 | 1,555 | 1,046 | 851 |

වෙනත් විශේෂ සායන

අංක 3 වගුව

| අංශය /වසර | සායනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| පවුල් වෛද්‍ය සායනය | | 2,123 | 5,336 | 6,929 | 5,275 |
| බෝ නොවන රෝග සායනය | 566 | 484 | 523 | 279 | 426 |
| සුවනාරි සායනය | | 74 | 58 | 15 | 439 |
| පවුල් සැලසුම් සායනය | | | | | 16 |

ජංගම සායන

අංක 4 වගුව

| අංශය / වසර | සායනයට පැමිණි රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| දියවැඩියා අධිරුධිර පීඩන සායනය | 3,046 | 3,548 | 3,897 | 5,413 | 2,960 |
| ළමා රෝග සායනය | 1,145 | 904 | 532 | 182 | - |
| මානසික රෝග සායනය | 2,609 | 2,344 | 1,915 | 1,895 | 1,601 |
| උගුර කණ නාසය සායනය | | | 339 | 135 | - |
| අන්තරාසර්ග රෝග සායනය | | | | | 1,659 |

ශල්‍ය අංශය

අංක 5 වගුව

| අංශය / වසර | රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| ශල්‍ය සායනය | 3,697 | 4,494 | 4,427 | 3,261 | 4,829 |
| එන්ඩොස්කොපි පරීක්ෂණ | 657 | 950 | 1,085 | 748 | 566 |
| සාමාන්‍ය ශල්‍යකර්ම | 889 | 1,023 | 1,047 | 675 | 767 |
| ශල්‍ය වාට්ටු 6 - ගැහැණු සහ පිරිමි | 2,631 | 3,541 | 3,512 | 2,544 | 2,284 |
| තුවාල සත්කාර ඒකකය | 19,926 | 15,556 | 16,745 | 11,179 | 9,316 |
| වාට්ටු 5 - තුවාල සත්කාර වාට්ටුව - ගැහැණු සහ පිරිමි | 408 | 358 | 279 | 119 | 119 |

අක්ෂි අංශය

අංක 6 වගුව

| අංශය / වසර | රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| අක්ෂි සායනය | 49,423 | 47,570 | 47,854 | 30,078 | 27,603 |
| අක්ෂි ශල්‍යකර්ම | 1,994 | 1,336 | 2,849 | 3,724 | 5,521 |
| අක්ෂි වාට්ටුව අංක 3 - පිරිමි හා ගැහුණු | 3,129 | 1,863 | 3,747 | 4,410 | 5,679 |
| Laser ප්‍රතිකාර | 962 | 1,648 | 988 | 723 | 1,072 |
| Refractive පරීක්ෂණ | 7,484 | 8,622 | 2,197 | 5,602 | 5,549 |

සහයක සේවා

අංක 7 වගුව

| අංශය / වසර | රෝගීන් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| රසායනාගාර පරීක්ෂණ | 90,605 | 111,620 | 101,066 | 69,697 | 53,177 |
| එක්ස්රේ පරීක්ෂණ | 2,796 | 4,728 | 3,791 | 1,929 | 1,816 |
| ECG පරීක්ෂණ | 7,344 | 7,776 | 8,882 | 5,409 | 3,869 |

## 2021 වසරේ සපුරාගත් ඉලක්ක

1) **වෛද්‍ය උපකරණ මිලදී ගැනීම්**

ප්‍රධාන වෛද්‍ය උපකරණ-

| | |
|---|---|
| Ophthalmic Operating Microscope යන්ත්‍රය | -Rs. 19,320,000/- |
| HbA1C Analyzer | -Rs. 4,800,000/- |
| ඩෙන්ටල් සී ආර් සිස්ටම් | -Rs. 1,385,000/- |
| 3 Phase connection to x Ray Unit | -Rs. 1,140,000/- |
| ශල්‍ය උපකරණ (අක්ෂි සහ සාමාන්‍ය ) | - Rs. 2,339,026/- |
| වෙනත් වෛද්‍ය උපකරණ | - Rs. 731,680/- |

2) **ලී බඩු සහ සවිකිරීම් , යන්ත්‍රෝපකරණ සහ පරිගණක උපකරණ මිලදී ගැනීම්**

| | |
|---|---|
| පරිගණක උපාංග -ලැයිස්තුව අනුව සහ මෘදුකාංග ගාස්තු | -Rs. 2,517,521.50 |
| ලී බඩු උපකරණ ( මේස , පුටු , කබඩ් යනාදිය ) | -Rs. 1,673,285.57 |
| යන්ත්‍රෝපකරණ | -Rs. 311,174.50 |

3) **යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**

**ප්‍රධාන ගොඩනැගිලි කාර්යන්**

| | |
|---|---|
| පවුල් වෛද්‍ය සායනය නවීකරණය | -Rs. 2,056,959.95 |
| රථගාල නවීකරණය කිරීම | -Rs. 2,716,912.48 |
| කොරිඩෝව ආශ්‍රිත ප්‍රදේශයේ ටයිල් ඇල්ලීම | -Rs. 1,326,241.90 |
| ශල්‍යාගාරයේ වැසිකිලි අලුත්වැඩියාව - | -Rs. 1,310,494.42 |

## 2021 වසරේ ප්‍රධාන පරිත්‍යාග

| පරිත්‍යාග කලේ/ ආයතනය | විස්තරය | මුලු වටිනකම -රු. |
|---|---|---|
| රසික පේදුරුආරච්චි මහතා<br>සෝමපාල පේදුරුආරච්චි මහතා<br>ප්‍රසාද් පේදුරුආරච්චි මහතා | Patient Monitors දෙකක්-(Edna IM 60)<br>ECG Machine එකක්-Edna (SE 03-01)<br>Emergency Trolly එකක් | 820,000.00 |
| කේ.ඩී.ඩී.පෙරේරා මහතා | HDU Beds එකක්<br>Hospital Beds 22 ක්<br>Beside Lockers 23 ක්<br>Matress 23 ක් | 1,723,000.00 |
| ජීව විද්‍යා ඉංජිනේරු අංශය , සෞඛ්‍ය අමාත්‍යාංශය | One X ray Unit ( XR 6000) | 14,968,018.12 |

# 2021/12/31 දිනට මූල්‍ය ප්‍රකාශන

## විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

# විජය කුමාරතුංග අනුස්මරණ රෝහල -සීදූව

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

**2021 දෙසැම්බර් 31 දිනින් අවසන් වර්ෂය සඳහා**

| | | 2021 | 2020 (ප්‍රතිශෝධනය කරන ලද) |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන (පුනරාවර්තන) | | 395,000,000.00 | 341,192,500.00 |
| ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රමක්ෂය | | 26,321,974.49 | 22,679,036.33 |
| ආධාර ලෙස ලද වත්කම් වල ක්‍රමක්ෂය | | 6,845,400.77 | 6,067,171.00 |
| වෙනත් ආදායම් | 15 | 25,252,362.08 | 14,751,483.40 |
| **මුළු ආදායම** | | 453,419,737.34 | 384,690,190.73 |
| | | | |
| **වියදම** | | | |
| වැටුප් වේතන සහ සේවක ප්‍රතිලාභ | 16 | 259,518,093.20 | 250,696,988.09 |
| සැපයුම් හා භාවිත දෑ | 19 | 100,745,343.97 | 126,416,282.95 |
| ක්ෂය | 17 | 33,167,375.26 | 28,746,207.33 |
| වෙනත් වියදම් | 18 | 53,573,975.01 | 52,537,663.05 |
| | | | |
| **මුළු වියදම** | | 447,004,787.44 | 458,397,141.42 |
| | | | |
| **අතිරික්තය /(හිඟ) අදාල කාලය සඳහා** | | **6,414,949.90** | **(73,706,950.69)** |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල -සීදූව**

**මූල්‍ය තත්වය ප්‍රකාශනය**

**2021 දෙසැම්බර් 31 දිනට**

| | | | |
|---|---|---|---|
| | | **2021** | **2020 (ප්‍රතිශෝධනය කරන ලද)** |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 1 | 22,898,279.98 | 31,095,873.32 |
| ලැබීමට නියමිත දෑ | 2 | 14,967,819.48 | 12,095,482.87 |
| තොග -බෙහෙත් ද්‍රව්‍ය හා අනෙකුත් තොග | 3 | 17,238,426.75 | 32,901,080.04 |
| පූර්ව ගෙවීම් - ඉදිරි වර්ෂයටඅදාල ගෙවීම් | 4 | 428,526.50 | 410,392.30 |
| | | 55,533,052.71 | 76,502,828.53 |
| ප්‍රාග්ධන කාරක ප්‍රගතිය | 5 | 31,643,712.74 | 1,440,493.87 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම් පිරියත හා උපකරණ | 6 | 95,317,602.67 | 70,076,762.96 |
| ඉඩම් හා ගොඩනැගිලි (WDV) | 7 | 188,641,551.94 | 182,002,647.21 |
| | | 283,959,154.61 | 252,079,410.17 |
| **මුළු වත්කම්** | | 371,135,920.06 | 330,022,732.57 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 8 | 10,269,948.72 | 15,223,163.55 |
| ණය හිමි | 9 | 125,270,495.16 | 114,371,239.50 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 10 | 50,012,539.28 | 46,035,785.38 |
| **මුලු වගකීම්** | | 185,552,983.16 | 175,630,188.43 |
| **ශුද්ධ වත්කම්** | | **185,582,936.90** | **154,392,544.14** |

**ශුද්ධ වත්කම් ස්කන්ධය**

| | | | |
|---|---|---|---|
| මූලධනය | 11 | 75,787,890.44 | 75,787,890.44 |
| රාජ්‍ය ප්‍රදාන - මූලධන | 12 | 205,749,603.75 | 192,071,578.24 |
| පරිත්‍යාග - විවිධ | 13 | 24,004,526.63 | 12,907,109.28 |
| ප්‍රාග්ධන සංචිත/ඉපයීම් | | 2,131,366.30 | 2,131,366.30 |
| සංචිත ප්‍රත්‍යාගණන | | - | - |
| සමුච්චිත අතිරික්තය/ඌනතාවය | 14 | (122,090,450.22) | (128,505,400.12) |
| ශුද්ධ වත්කම්/ ස්කන්ධය | | **185,582,936.90** | **154,392,544.14** |

මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටින අතර අධ්‍යක්ෂ මණ්ඩලයවිසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී

Chandrika Kumarathunga

Chairperson

Board of Directors

Wijaya Kumarathunga Memorial Hospital

Date : 16/3/2022

CHAIRPERSON
WIJAYA KUMARATHUNGA MEMORIAL HOSPITAL
SEEDUWA.

N.A. Umagiliya

Director

Board of Directors

Wijaya Kumarathunga Memorial Hospital

Date : 15/03/2022

DIRECTOR BOARD
WIJAYA KUMARATUNGA MEMORIAL HOSPITAL
SEEDUWA.

Dr. U.L.R.M. Perera

Director

Wijaya Kumarathunga Memorial Hospital

Date : 20/02/2022

Director
Wijaya Kumaratunga Memorial Hospital
Seeduwa.

P.D.T.P.N. Bernard

Accountant

Wijaya Kumarathunga Memorial Hospital

Date : 20/02/2022

Accountant
Wijaya Kumaratunga Memorial Hospital
Seeduwa

| | |
|---|---|
| **විජය කුමාරතුංග අනුස්මරණ රෝහල -සීදුව** | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 2021 දෙසැම්බර් 31 අවසන් වන වසර සඳහා** | |
| | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහ** | |
| | |
| අතිරික්තය/ හිග | 6,414,949.90 |
| <u>මුදල් නොවන විචලනයන්</u> | |
| ක්ෂය | 33,167,375.26 |
| ක්‍රමක්ෂය | (33,167,375.26) |
| වැඩිවීම/(අඩුවීම්) - උපචිත වියදම් | (4,953,214.83) |
| වැඩිවීම/(අඩුවීම්) - ණය හිමියෝ | 10,899,255.66 |
| වැඩිවීම/(අඩුවීම්) - භාණ්ඩ තොග | 15,662,653.29 |
| වැඩිවීම/(අඩුවීම්) - පාරිතෝෂිත වියදම් | 3,976,753.90 |
| වැඩිවීම/(අඩුවීම් ) - ඉදිරියට ගෙවීම් | (18,134.20) |
| වැඩිවීම් / (අඩුවීම්) - ලැබීමට නියමිත දෑ | (2,872,336.61) |
| **මාරුකල හා ඉවත් කල වත්කම්වල ශුද්ධ වටිනාකම** | 37.00 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලන | 29,109,964.11 |
| | |
| | |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගැලීම්** | |
| පිරියත හා උපකරණ මිලදී ගැනිම | (47,104,338.58) |
| ඉදිකිරීම් ප්‍රගතිය | (30,203,218.87) |
| ලද ප්‍රාග්ධන ප්‍රධාන | 40,000,000.00 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගැලීම් | (37,307,557.45) |
| | |
| | |
| | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගැලීම්** | |
| ශුද්ධ මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලින් | |
| ශුද්ධ වැඩිවීම/අඩුවීම - මුදල් හා මුදල් වලට සමාන දෑ | (8,197,593.34) |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - වර්ෂය ආරම්භයේදී | 31,095,873.32 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ - වර්ෂය අවසානයේදී | 22,898,279.98 |
| | |
| | |
| **<u>මුදල් ගලන ප්‍රකාශනයේ සටහන්</u>** | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | |
| බැංකු මුදල් | 22,772,575.98 |
| අතැති මුදල් | 125,704.00 |
| | 22,898,279.98 |
| | |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව**

**ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය**

**2021 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා**

| | රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධන | වෙනත් පරිත්‍යාග | වි.කු.අ.රෝ පදනම | ආයෝජන මණ්ඩලය | UDA | සංචිත ප්‍රාග්ධන ලාභ (හිග) | Revauation Reserve | ශුද්ධ අතිරික්තය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 192,071,578.24 | 12,907,109.28 | 29,632,139.32 | 28,155,751.12 | 18,000,000.00 | 2,131,366.30 | - | (128,505,400.12) | 154,392,544.14 |
| | | | | | | | | | - |
| වසර තුල ස්ථාවර වත්කම් වැඩි වීම | - | - | - | - | - | - | - | - | - |
| | | | | | | | | | - |
| ලද ප්‍රාග්ධන ප්‍රධාන වසර තුල | 40,000,000.00 | 17,942,818.12 | - | - | - | - | - | - | 57,942,818.12 |
| | | | | | | | | | - |
| ප්‍රාග්ධන ප්‍රධාන ක්‍රම ක්ෂය | (26,321,974.49) | (6,845,400.77) | - | - | - | - | - | - | (33,167,375.26) |
| | | | | | | | | | - |
| ශුද්ධ අතිරික්තය/( හිගය ) කාලය තුල | - | - | - | - | - | - | - | 6,414,949.90 | 6,414,949.90 |
| | | | | | | | | | - |
| පෙර වසරේ ගැලපුම් | | - | - | - | - | - | - | - | - |
| | | | | | | | | | - |
| 2021.12.31 දිනට ශේෂය | **205,749,603.75** | **24,004,526.63** | **29,632,139.32** | **28,155,751.12** | **18,000,000.00** | **2,131,366.30** | **-** | **(122,090,450.22)** | **185,582,936.90** |

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදූව**

**2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලැයිස්තුව**

(Rs)

| අයිතම | පිරිවැය 2021/01/01 දිනට | වසරේ එකතුවීම | වසරේ ඉවත්කිරීම | 31-12-2021 දිනට | අනුපාතය | සමුච්චිත ක්ෂය 01.01.2021 දිනට | වසරේ එකතුවීම් වල ක්ෂය | වසරේ ඉවත්කිරීම වල ක්ෂය | 31-12-2021 දිනට සමුච්චිත ක්ෂය | 2021/12/31 දිනට ලියාහැරි අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 27,159,873.50 | - | | 27,159,873.50 | | - | | | - | 27,159,873.50 |
| ගොඩනැගිලි සහ සවිකිරීම් | 202,951,062.75 | 10,916,251.01 | - | 213,867,313.76 | 2% | 48,108,289.04 | 4,277,346.28 | | 52,385,635.32 | 161,481,678.44 |
| වාහන | 26,458,792.90 | 350,000.00 | - | 26,808,792.90 | 20% | 21,358,787.90 | 1,770,000.00 | | 23,128,787.90 | 3,680,005.00 |
| ලී බඩු සවිකිරීම් සහ | 13,511,137.37 | 3,438,785.57 | 2,000.00 | 16,947,922.94 | 10% | 9,285,819.78 | 1,007,769.17 | 1,998.00 | 10,291,590.95 | 6,656,331.99 |
| උපකරණ | | | - | | | | - | | | |
| යන්ත්‍රෝපකරණ | 27,502,477.28 | 395,174.50 | 24,600.00 | 27,873,051.78 | 15% | 12,557,048.07 | 3,476,900.71 | 24,597.00 | 16,009,351.78 | 11,863,700.00 |
| | | | - | | | | - | | | |
| පරිගණක | 3,655,646.40 | 2,517,521.50 | 29,683.00 | 6,391,484.90 | 20% | 2,297,988.40 | 1,011,280.30 | 29,677.00 | 3,329,191.70 | 3,062,293.20 |
| වෛද්‍ය උපකරණ වලට මාරු කිරීම් | 248,000.00 | | - | | | 49,600.00 | - | | | |
| වෛද්‍ය | 245,293,954.24 | 47,429,424.12 | 3,178,963.16 | 289,296,415.20 | 15% | 200,833,201.08 | 21,624,078.80 | 3,178,937.16 | 219,241,142.72 | 70,055,272.48 |
| උපකරණ | (248,000.00) | | - | | | (37,200.00) | | | | |
| පරිගණක වලින් මාරු කිරීම් | | | | | | | | | | |
| පුහුණු කිරීම | | | | - | 10% | | | | | |
| **එකතුව** | 546,532,944.44 | 65,047,156.70 | 3,235,246.16 | 608,344,854.98 | | 294,453,534.27 | 33,167,375.26 | 3,235,209.16 | 324,385,700.37 | 283,959,154.61 |
| | | | | - | | | - | | | |
| පරිත්‍යාග | | 17,942,818.12 | | | | | | | | |
| ස්ථාවර වත්කම් වැඩි වීම | | 47,104,338.58 | 47,104,338.58 | - | | | | | | |

| | | | |
|---|---|---|---|
| **විජය කුමාරතුංග අනුස්මරණ රෝහල - සීදුව** | | | |
| **ගිණුම් සඳහා සටහන්** | | | |
| | | **2021** | **2020( ප්‍රතිශෝධිත )** |
| **මුදල් හා මුදල් සමාන දෑ** | 1 | | |
| බැංකුගත මුදල් | | 22,772,575.98 | 31,034,983.32 |
| සුළු මුදල් | | - | - |
| අතැති මුදල් | | 125,704.00 | 60,890.00 |
| | | 22,898,279.98 | 31,095,873.32 |
| **ලැබීමට නියමිත දෑ/ සේවක ණය** | 2 | | |
| තැන්පත් ගිණුම | | 385,429.10 | 385,429.10 |
| උත්සව අත්තිකාරම් | | 181,250.00 | - |
| විශේෂ අත්තිකාරම් | | - | 24,800.00 |
| ලැබීමට ඇති ආදායම්- ආපනශාලාව සහ කිරි හල | | 105,746.85 | 104,600.00 |
| ලැබීමට ඇති - හෙද නේවාසිකාගාර -කුලී | | | 2,219.18 |
| ප්‍රතිපූරණය වීමට ඇති වියදම් - කොවිඩ් මධ්‍යස්ථානය | | 1,118,558.94 | |
| ආපදා ණය | | 13,176,834.59 | 11,578,434.59 |
| | | 14,967,819.48 | 12,095,482.87 |
| **තොග -** | 3 | | |
| ලිපි ද්‍රව්‍ය | | 403,738.05 | 345,780.48 |
| ඖෂධ | | 13,834,354.79 | 30,178,091.57 |
| රසායාගාර රසායනික ද්‍රව්‍ය | | 1,899,198.38 | 1,304,077.30 |
| ලිනන් තොග | | 270,003.74 | 200,794.24 |
| පොදු ගබඩා තොග | | 403,376.58 | 443,773.54 |
| අළුත්වැඩියා හා නඩත්තු | | 148,492.00 | 106,254.60 |
| එක්ස්රේ අංශ තොග | | 242,311.20 | 185,756.90 |
| දන්ත අංශ තොග | | 36,952.01 | 136,551.41 |
| | | 17,238,426.75 | 32,901,080.04 |
| **පූර් ව ගෙවීම - ඉදිරි වර්ෂයට අදාල ගෙවීම්** | 4 | | |
| සේවා ගිවිසුම් වෛද්‍ය උපකරණ | | 139,314.82 | 145,865.29 |
| සේවා ගිවිසුම් ෆැක්ස් | | 6,107.14 | |
| සේවා ගිවිසුම් මුද්‍රණ යන්ත්‍ර | | 1,618.00 | |
| සේවා ගිවිසුම් ඩුප්ලෝ යන්ත්‍රය | | 9,737.51 | 6,844.36 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු අලුත් කිරීම | | 68,236.53 | 72,682.65 |
| ගිණුම්කරණ මෘදුකාංග - පද්ධති නඩත්තුව | | 12,500.00 | |
| සේවා ගිවිසුම් -විදුලි සෝපානය | | 191,012.50 | 185,000.00 |
| | | 428,526.50 | 410,392.30 |
| **ප්‍රාග්ධන කාරක ප්‍රගතිය** | 5 | | |
| ඉදිකිරීම් ප්‍රගතිය නව ගොඩනැගිල්ල | | 662,076.27 | 662,076.27 |
| ඉදිකිරිම් ප්‍රගතිය- රථ ගාල | | - | 778,417.60 |
| ඉදිකිරීම් ප්‍රගතිය නව ගොඩනැගිල්ල 2 | | 30,981,636.47 | |
| | | 31,643,712.74 | 1,440,493.87 |
| **යටිතල පහසුකම් පිරියත හා උපකරණ** | 6 | | |
| යන්ත්‍රෝපකරණ | | 11,863,700.00 | 14,945,429.21 |
| ලී බඩු | | 6,656,331.99 | 4,225,317.59 |
| වාහන | | 3,680,005.00 | 5,100,005.00 |
| පරිගණක | | 3,062,293.20 | 1,308,058.00 |
| වෛද්‍ය උපකරණ | | 70,055,272.48 | 44,497,953.16 |
| පුහුණු වැඩසටහන් | | - | |
| | | 95,317,602.67 | 70,076,762.96 |

| | | | |
|---|---|---|---|
| <u>**ඉඩම් හා ගොඩනැගිලි**</u> | 7 | | |
| ඉඩම් | | 27,159,873.50 | 27,159,873.50 |
| ගොඩනැගිලි සවිකිරීම් | | 161,481,678.44 | 154,842,773.71 |
| | | 188,641,551.94 | 182,002,647.21 |
| <u>**උපචිත වියදම්**</u> | 8 | | |
| විගණන ගාස්තු | | 700,000.00 | 1,345,500.00 |
| ගමන් වියදම් | | | 2,580.00 |
| විදුලි බල වියදම් | | 835,526.70 | 733,392.00 |
| දුරකථන ගාස්තු | | 26,651.15 | 32,001.03 |
| ඉන්ධන බිල් | | 124,886.00 | 65,344.00 |
| ගෑස් | | | |
| සංයුක්ත දීමනා | | 42,712.00 | 8,300.00 |
| යන්ත්‍ර අළුත්වැඩියා බිල් | | 70,200.00 | 63,936.00 |
| වාහන අළුත්වැඩියාව-රක්ෂණ බිල් | | 22,000.00 | |
| වාහන අළුත්වැඩියා බිල් | | 43,895.94 | |
| වෛද්‍ය උපකරණ අළුත්වැඩියා බිල් | | 276,098.49 | 434,520.00 |
| වෛද්‍ය උපකරණ අළුත්වැඩියා බිල් | | | 4,700.00 |
| වෛද්‍ය උපකරණ බිල් | | | 1,335,198.60 |
| ජල බිල්පත් | | 5,950.00 | 5,950.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සඳහා දීමනා | | 35,000.00 | |
| පුවත්පත් දැන්වීම් ගාස්තු | | | 116,100.00 |
| අපද්‍රව්‍ය කළමණාකරණ බිල් | | 90,660.60 | |
| ගොඩනැගිලි අළුත්වැඩියා බිල්පත් | | 9,180.00 | |
| නිතිඥ ගාස්තු | | 1,000.00 | 7,500.00 |
| විවිධ ගෙවිය යුතු බිල් | | 2,300.00 | 2,180.00 |
| | | 2,286,060.88 | 4,157,201.63 |
| | | | |
| <u>**ගෙවීමට ඇති දෑ**</u> | | | |
| ආපසු ලබා දෙන ටෙන්ඩර් තැන්පත් | | 756,340.00 | 1,661,194.00 |
| රැඳවුම් මුදල් | | 933,183.99 | 2,586,205.23 |
| මුද්දර බදු | | 200.00 | 425.00 |
| කොන්ත්‍රත් හා ආදේශක කාර්ය මණ්ඩල ගෙවීම් | | 833,341.76 | 1,280,998.08 |
| දීමනාව - බාහිර වෛද්‍යවරු | | 376,319.55 | 109,571.73 |
| අනතුරු දීමනා-ගෙවිය යුතු-හෙද කාර්ය මණ්ඩලය | | 7,700.00 | |
| අභ්‍යාසලාභී දීමනාව - සිසු හෙද | | | 338,540.60 |
| වැඩ බලන දීමනා - ප්‍රධාන වෛද්‍ය නිලධාරී | | | 212,166.17 |
| පුහුණු කළමණාකාර සහකාර දිමනා | | 12,250.00 | 20,000.00 |
| EPF ETF ගෙවීම් | | 127,040.05 | 228,242.47 |
| අතිකාල හා PH ගෙවීම් | | 4,898,653.74 | 4,390,983.89 |
| සුහසාධක , කතෝලික, වෛද්‍ය සංගම් සඳහා ගෙවීම් | | | 3,231.00 |
| වෛද්‍ය ඩබ්.පී.ඒ.සී.ප්‍රනාන්දු සඳහා ගෙවීමට ඇති | | | 120,545.00 |
| අවලංගු වූ චෙක් සඳහා ගෙවීමට ඇති - යමුනා මිය | | 38,858.75 | 38,858.75 |
| ගෙවිය යුතු දුරකථන දීමනා-වෛද්‍ය පෙරේරා | | | 75,000.00 |
| | | **7,983,887.84** | **11,065,961.92** |
| | | 10,269,948.72 | 15,223,163.55 |

| | | | |
|---|---|---|---|
| **ණය හිමි** | 9 | | |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | | - | 35,041,794.50 |
| වෛද්‍ය සැපයුම් අංශය | | 90,595,685.11 | 77,168,411.70 |
| එරන්දි සප්ලයස් | | 446,609.81 | 355,343.38 |
| නලින් තුෂාර / පනාගොඩ ක්ලීන්ර්ස් | | - | 189,284.00 |
| Star ක්ලීනර් ස් | | 214,373.00 | |
| රාජපක්ෂ | | - | 60,068.00 |
| සිසිලි හනාරෝ | | - | 10,122.84 |
| ඔමේගා ජැන්ටර් සර්විසස් | | - | 912,995.98 |
| සුප ර් විල්ෂයින් | | 2,233,872.57 | |
| ලංකා ධීවර සංස්ථාව | | 29,898.20 | 78,184.20 |
| රක්නා ලංකා ආරක්ෂක සමාගම | | 768,420.00 | |
| එල් ආර් ඩී සී සෙකියුරිටි සර් විසස් | | - | 555,034.90 |
| CECB | | 30,981,636.47 | - |
| | | 125,270,495.16 | 114,371,239.50 |
| | | | |
| **සංචිත** | 10 | | |
| පරිතෝෂිත ප්‍රතිපාදන | | 50,012,539.28 | 46,035,785.38 |
| | | 50,012,539.28 | 46,035,785.38 |
| | | | |
| **ප්‍රාග්ධන / මූලධනය** | 11 | | |
| විජය කුමාරතුංග අනුස්මරණ පදනම | | 29,632,139.32 | 29,632,139.32 |
| ආයෝජන මණ්ඩලය | | 28,155,751.12 | 28,155,751.12 |
| U.D.A. | | 18,000,000.00 | 18,000,000.00 |
| | | 75,787,890.44 | 75,787,890.44 |
| | | | |
| **රාජ්‍ය ප්‍රධාන - මූලධන** | 12 | | |
| 01 . 01 දිනට | | 192,071,578.24 | 189,957,614.57 |
| වසර තුල ලැබීම් | | 40,000,000.00 | 24,793,000.00 |
| ක්‍රමක්ෂය | | 26,321,974.49 | 22,679,036.33 |
| 31.12 දිනට | | 205,749,603.75 | 192,071,578.24 |
| | | | |
| **පරිත්‍යාග** | 13 | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | | 12,907,109.28 | 14,632,280.28 |
| වර්ෂය තුල ලද පරිත්‍යාග | | 17,942,818.12 | 4,342,000.00 |
| ආධාර ලෙස ලද ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය | | 6,845,400.77 | 6,067,171.00 |
| | | 24,004,526.63 | 12,907,109.28 |
| | | | |
| **සමුච්චිත ඌනතාවය** | 14 | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය at 01.01 | | (128,505,400.12) | (54,798,449.43) |
| කාලසීමාව තුල අතිරික්තය | | 6,414,949.90 | (73,706,950.69) |
| පූර්ව වසරේ ගැලපුම් | | | |
| | | (122,090,450.22) | (128,505,400.12) |

| | | | |
|---|---|---|---|
| **වෙනත් ආදායම්** | 15 | | |
| පුද්ගලික වෛද්‍ය සහතික ගාස්තු | | 136,410.00 | 111,000.00 |
| විවිධ ආදායම් | | 1,434,526.49 | 560,302.32 |
| ටෙන්ඩර් තැන්පත් - ආපසු නොගෙවන | | 251,600.00 | 237,000.00 |
| ආපදා ණය පොලී | | 538,209.79 | 412,051.28 |
| අක්ෂි සැත්කම් ගාස්තු - ප්‍රධන | | 15,504,700.00 | 8,024,000.00 |
| අක්ෂි සැත්කම් ගාස්තු - සුළු | | 275,640.00 | 77,000.00 |
| සාමාන්‍ය සැත්කම් - ප්‍රධාන | | 2,026,000.00 | 1,467,000.00 |
| සාමාන්‍ය සැත්කම් - සුළු | | 674,150.00 | 727,750.00 |
| විශේෂ අත්තිකාරම් මත පොලී | | 9,205.80 | 10,469.80 |
| FFA පරීක්ෂණ | | 21,600.00 | 1,000.00 |
| FLT පරීක්ෂණ | | 72,300.00 | 47,000.00 |
| Peripheral පරීක්ෂණ | | 46,800.00 | 39,000.00 |
| YAG PI පරීක්ෂණ | | 46,040.00 | 30,000.00 |
| PRP පරීක්ෂණ | | 553,750.00 | 163,100.00 |
| YAG CAPSULOMY පරීක්ෂණ | | 160,880.00 | 232,400.00 |
| OCT පරීක්ෂණ | | 1,911,600.00 | 1,066,000.00 |
| Diet පරීක්ෂණ | | 7,800.00 | 7,860.00 |
| Upper GI පරීක්ෂණ | | 52,600.00 | 79,000.00 |
| Sigmad copy පරීක්ෂණ | | 275,400.00 | 301,000.00 |
| Colonoscopy පරීක්ෂණ | | 49,800.00 | 34,000.00 |
| Duplex පරීක්ෂණ | | 543,000.00 | 486,300.00 |
| Breast පරීක්ෂණ | | - | 500.00 |
| Lipid Profile පරීක්ෂණ | | 588,950.00 | |
| PRP injection පරීක්ෂණ | | 600.00 | - |
| HVF පරීක්ෂණ | | 2,400.00 | - |
| Biopsy පරීක්ෂණ | | 60,000.00 | - |
| Grid පරීක්ෂණ | | 1,800.00 | |
| Lid පරීක්ෂණ | | 2,400.00 | |
| හෙල්ත් පැකේජ් | | 4,200.00 | 37,800.00 |
| වෙනත් පරිත්‍යාග | | - | 599,950.00 |
| | | **25,252,362.08** | 14,751,483.40 |
| **වියදම්** | 16 | | |
| **වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ** | | | |
| **වැටුප් හා දීමනා** | | | |
| වැටුප් හා දීමනා - වෛද්‍ය නිලධාරි | | 52,318,179.17 | 53,415,853.92 |
| වැටුප් හා දීමනා - වෙනත් | | 16,052,013.61 | 14,922,329.43 |
| වැටුප් හා දීමනා - පරිපූරක | | 12,606,870.15 | 11,870,915.16 |
| වැටුප් හා දීමනා - හෙද | | 59,107,486.02 | 50,029,565.55 |
| වැටුප් හා දීමනා - සුළු සේවක | | 36,287,832.62 | 33,527,297.23 |
| E.P.F.12 % | | 18,462,305.28 | 17,255,475.70 |
| E.T.F. 3% | | 4,615,577.69 | 4,313,869.90 |
| E.T.F අධිභාර | | - | 851.00 |
| අතිකාල - වෙනත් | | 3,813,191.53 | 4,128,748.73 |
| අතිකාල - පරිපූරක වෛද්‍ය | | 3,784,619.54 | 4,500,442.53 |
| අතිකාල - හෙද | | 15,902,377.73 | 14,939,495.20 |
| අතිකාල - සුළු සේවක | | 9,325,510.38 | 8,873,165.17 |
| අතිකාල ගෙවීම් වෛද්‍ය නිලධාරි | | 21,351,688.08 | 23,585,954.94 |
| පාරිතෝෂික වියදම් | | 5,890,441.40 | 9,333,023.63 |
| | | 259,518,093.20 | 250,696,988.09 |

| | | | |
|---|---|---|---|
| **ක්ෂය** | 17 | | |
| ගොඩනැගිලි සවිකිරීම් | | 4,277,346.28 | 4,059,021.25 |
| ලී බඩු සවිකිරීම් උපකරණ | | 1,007,769.17 | 739,608.43 |
| යන්ත්‍රෝපකරණ | | 3,476,900.71 | 3,523,818.46 |
| පරිගණක | | 1,011,280.30 | 623,131.08 |
| වෛද්‍ය උපකරණ | | 21,624,078.80 | 18,100,628.11 |
| වාහන | | 1,770,000.00 | 1,700,000.00 |
| | | 33,167,375.26 | 28,746,207.33 |
| | | | |
| **ගමන් ගාස්තු** | 18 | | |
| සංයුක්ත දීමනා | | 186,686.00 | 228,908.00 |
| ගමන් වියදම් | | 690,899.00 | 690,693.00 |
| **නඩත්තු** | | | |
| විදුලිය | | 10,118,667.40 | 9,225,411.25 |
| ජලය | | 1,220,290.20 | 1,264,044.36 |
| දුරකථන | | 317,993.23 | 326,702.64 |
| තැපැල් | | 32,310.00 | 28,205.00 |
| **අලුත්වැඩියා හා නඩත්තු** | | | |
| අලුත්වැඩියා හා නඩත්තු - ගොඩනැගිලි | | 1,718,100.92 | 7,764,268.94 |
| අලුත්වැඩියා හා නඩත්තු - යන්ත්‍රෝපකරණ | | 1,246,740.97 | 1,357,055.67 |
| අලුත්වැඩියා හා නඩත්තු - වාහන | | 844,247.12 | 667,319.38 |
| අලුත්වැඩියා හා නඩත්තු - පරිගණක | | 146,513.55 | 91,850.00 |
| අලුත්වැඩියා හා නඩත්තු - වෛද්‍ය උපකරණ | | 3,326,539.71 | 1,646,277.15 |
| අලුත්වැඩියා හා නඩත්තු - ලී බඩු | | - | 4,400.00 |
| **කොන්ත්‍රාත්මය සේවා** | | | |
| පිරිසිදු කිරීම් | | 10,239,231.83 | 9,673,355.58 |
| කිලිටි රෙදි සේදීම | | 2,170,875.80 | 3,393,070.00 |
| ආරක්ෂක | | 9,304,875.00 | 6,410,022.86 |
| ආහාර සැපයුම් | | 5,767,982.78 | 4,656,216.98 |
| අධ්‍යක්ෂ මණ්ඩල ,විගණන කමිටු සාමාජික ගාස්තු | | 198,000.00 | 72,000.00 |
| ලේකම් සදහා ගෙවීම් | | 405,000.00 | 420,000.00 |
| විවිධ වියදම් | | 383,841.02 | 185,530.00 |
| ප්‍රචාරක දැන්වීම් | | 1,232,644.50 | 1,025,711.10 |
| බැංකු ගාස්තු | | 37,890.00 | 37,445.00 |
| විගණන ගාස්තු | | 700,000.00 | 696,000.00 |
| නීතිඥ ගාස්තු | | 82,800.00 | 355,524.00 |
| කුලී | | 528,861.25 | 479,210.61 |
| විදුලි ජනක යන්ත්‍ර ඉන්ධන | | 145,400.00 | 218,400.00 |
| සංග්‍රහ වියදම් | | 135,248.00 | 45,856.00 |
| ලිපිද්‍රව්‍ය සහ නඩත්තු ද්‍රව්‍ය | | 325,794.60 | 121,963.00 |
| NAITA පුහුණු දීමනා | | 336,540.00 | 306,278.95 |
| අපද්‍රව්‍ය කළමණාකරණය | | 764,932.27 | 166,558.56 |
| වාහන වියදම් | | | |
| ඉන්ධන | | 755,968.72 | 771,928.00 |
| රක්ෂණ | | 178,644.14 | 198,112.02 |
| ලියාපදිංචි / බලපත්‍ර ගාස්තු | | 30,457.00 | 9,345.00 |
| | | 53,573,975.01 | 52,537,663.05 |
| | | | |

| සැපයුම් භාවිත | 2021 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භක තොග | මිලදී ගැනීම් | අවසාන තොග | වසරේ පරිභෝජනය | ආරම්භක තොග | මිලදී ගැනීම් | අවසාන තොග | වසරේ පරිභෝජනය |
| | 01.01.2021 | 2021 | 31.12.2021දිනට | 2021 | 01.01.2021 | 2021 | 31.12.2021දිනට | 2021 |
| රසායනාගාර රසායනික ද්‍රව්‍ය | 1,304,077.30 | 4,116,547.39 | 1,899,198.38 | 3,521,426.31 | 1,365,476.88 | 1,590,500.71 | 1,304,077.30 | 1,651,900.29 |
| එක්ස්රේ පටල, රසායනාගාර ද්‍රව්‍ය | 185,756.90 | 328,679.04 | 242,311.20 | 272,124.74 | 212,861.17 | 324,058.08 | 185,756.90 | 351,162.35 |
| ඖෂධ | 30,178,091.57 | 73,479,839.84 | 13,834,354.79 | 89,823,576.62 | 25,311,221.23 | 125,256,841.48 | 30,178,091.57 | 120,389,971.14 |
| ලිනන් වර් ග | 200,794.24 | 804,540.00 | 270,003.74 | 735,330.50 | 198,279.72 | 314,994.70 | 200,794.24 | 312,480.18 |
| පරිභෝජ්‍ය, පොදු ගබඩාව | 443,773.54 | 908,877.99 | 403,376.58 | 949,274.95 | 407,362.21 | 1,026,040.24 | 443,773.54 | 989,628.91 |
| ලිපි ද්‍රව්‍ය | 345,780.48 | 879,227.40 | 403,738.05 | 821,269.83 | 566,245.92 | 702,547.54 | 345,780.48 | 923,012.98 |
| අලුත්වැඩියා, නඩත්තු (ii) | 106,254.60 | 407,951.80 | 148,492.00 | 365,714.40 | 85,994.20 | 379,064.99 | 106,254.60 | 358,804.59 |
| දන්ත පරිභෝජනය | 136,551.41 | - | 36,952.01 | 99,599.40 | 22,503.05 | 227,034.99 | 136,551.41 | 112,986.63 |
| | 32,901,080.04 | 80,925,663.46 | 17,238,426.75 | 96,588,316.75 | 28,169,944.38 | 129,821,082.73 | 32,901,080.04 | 125,089,947.07 |

| සැපයුම් භාවිතය | 19 | | |
|---|---|---|---|
| රසායනාගාර රසායනික ද්‍රව්‍ය | | 3,521,426.31 | 1,651,900.29 |
| එක්ස්රේ පටල, රසායනාගාර ද්‍රව්‍ය | | 272,124.74 | 351,162.35 |
| ඖෂධ | | 89,823,576.62 | 120,389,971.14 |
| ලිනන් වර්ග | | 735,330.50 | 312,480.18 |
| පරිභෝජ්‍ය, පොදු ගබඩාව | | 949,274.95 | 989,628.91 |
| ලිපි ද්‍රව්‍ය | | 821,269.83 | 923,012.98 |
| අලුත්වැඩියා, නඩත්තු (ii) | | 365,714.40 | 358,804.59 |
| දන්ත පරිභෝජනය | | 99,599.40 | 112,986.63 |
| වෛද්‍ය උපකරණ පරිභෝජ්‍ය | | 3,846,490.00 | 1,019,643.52 |
| ගෑස් | | 310,537.22 | 306,692.36 |
| | | 100,745,343.97 | 126,416,282.95 |

# සුවිශේෂී ගිණුම් ප්‍රතිපත්ති

**පොදු**

**සැකසීමේ පදනම**

1.1.1 මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව සකසා ඇත.

1.1.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්ප්‍රදාය යටතේ සකසා ඇත.

1.1.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකසා ඇත.

**රාජ්‍ය ප්‍රදාන**

1.2 මණ්ඩලයට රාජ්‍ය ප්‍රදාන වර්ග දෙකකින් ලැබේ. ඒවා නම්
ප්‍රාග්ධන ප්‍රදාන
**පුනරාවර්තන** ප්‍රදාන

1.2.1 ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් පිරිවිතර වලට අනුව ගණනය කෙරේ. ප්‍රාග්ධන ප්‍රදාන වත්කම්වල භාවිත ආයුකාලය පදනම කරගත් ආදායමක් ලෙස හඳුනාගන්නා විලම්බිත ආදායම් (වාර්ෂිකව ක්ෂයවන වත්කම් වටිනාකම වසරේ ආදායමක් ලෙස ගණන් ගැනේ) ක්‍රමය තුල පිළිගැනේ.

1.2.2 පුනරාවර්තන ප්‍රධාන අදාල කාලය තුල ආදායමක් ලෙස හඳුනා ගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

## 1.3 බදු අයකිරීම්

අදාළ වසර තුල ඌනතාවයක් ලබා ඇති හෙයින් මණ්ඩලය බදු සඳහා කිසිදු ප්‍රතිපාදන සැළසීමක් කර නොමැත.

1.4 **සංසන්දනාත්මක තොරතුරු**

මණ්ඩලය නිරතුරුව ගිණුම් ප්‍රතිපත්ති අනුව පූර්ව වසර වල අගයන් සලකමින් කටයුතු කර ඇත.

2. **වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම**

## 2.1 දේපල, පිරියත හා උපකරණ අගය ක්ෂයවීම හා ප්‍රතිඇගයුම

2.1.1 දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අඩුකර ඇගයුමට දක්වා ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය යනු ඒවා ඉදිකිරීම් මිලදී ගැනීමේ පිරිවැය සමඟ වත්කම් අපේක්ෂිත භාවිතාව සඳහා පත් කිරීමට අදාළව කළ අතුරු වියදම් ඇතුළත් වේ.

සේවා ලබා දීමට හැකි වන පරිදි හෝ සේවා ධාරිතාවය වැඩිකරලීම සඳහා ප්‍රාග්ධන වියදම් සිදු කළ ස්ථාවර තත්වයේ යුතු වත්කම් වැඩිදියුණු කිරීම හෝ අත්පත් කර ගැනීම සඳහා කළ වියදම් **මූලධන වියදම් වශයෙන් සලකනු ලැබේ.**

2.1.2 සින්නක්කර ඉඩම් හැර වත්කම් පහත දැක්වෙන අනුපාතයට සෘජු රේඛිය ක්‍රමය භාවිතා කර **පහත සඳහන් ප්‍රමාණයන්ට ක්ෂය වීම් ගණන් බලා ඇත.**

| | |
|---|---|
| ගොඩනැගිලි හා සවිකිරීම් | 2% |
| වාහන | 20% |
| ලිබඩු, සවිකිරීම් හා උපකරණ | 10% |
| යන්ත්‍රෝපකරණ | 15% |
| වෛද්‍ය උපකරණ | 15% |
| පරිගණක | 20% |

2.1.3 මිලදි ගත් වසරට හා මිලදී ගැනීමට අදාලව **ක්ෂය** දක්වා ඇති අතර ඉවත් කිරීමේ වසරේ කිසිදු ක්ෂය දැක්වීමක් කර නොමැත.

2.1.4 මූල්‍ය ගලන ප්‍රකාශය තුල මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල් හා බැංකුගත මුදල් ඇතුළත් වේ.

**3. බැරකම් හා ප්‍රතිපාදන**

**3.1 ප්‍රාග්ධන බැදීම් හා අවිනිශ්චිත බැරකම්**

ශේෂපත්‍ර දිනට වූ සියළු ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන **බැදීම්** වියදම් වෙන්කිරීම් හා **අවිනිශ්චිත** බැරකම් ගිණුම් සටහන් වල දක්වා ඇත.

**3.2 වට්ටෝරු භාණ්ඩ / තොග ඇගයුම**

තොග පිරිවැයට ඇගයුම් කර ඇත.

**4. ආදායම් හා වියදම්**

**4.1 ආදායම්**

4.1.1 මණ්ඩලයේ ආදායම් තුල පුද්ගලික වෛද්‍ය සහතික හා රාජ්‍ය පුනරාවර්තන ප්‍රදාන සහ විවිධ ආදායම් සඳහා ගාස්තු ඇතුළත් වේ.

4.1.2 සියළු ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

**4.2 වියදම**

රෝගී ප්‍රතිකාර ලබා දීමට හා ප්‍රාග්ධන වත්කම් සක්‍රිය ලෙස නඩත්තු කරලීමට අදාල සියළු වියදම් වසරේ අතිරික්තය හෝ හිගය ගණනය කිරීමේ දී උපචිත පදනම මත ආදායමට බැර කර ඇත.

ආදායම් හා වියදම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී, වියදම් ක්‍රමයේ ස්වභාවය මගින් අධ්‍යක්ෂක මණ්ඩලයේ කාර්යසාධනයේ මූලිකාංග ප්‍රමාණවත් ව පැහැදිලි වන ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

මගේ අංකය / எனது இல. / My No. } ටීඑච්බී/ඒ/ඩබ්කේඑම්එච් /එෆ්ඒ/2021/02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූනි 30 දින

සභාපති,
විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය.

**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.218,607,966 ක් වූ වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතුකර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) වත්කම් වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් එම වත්කම් වලට අදාල වර්ෂයේ වියදම රු. 148,000 වැඩියෙන් ගණනය කිරීම නිසා වර්ෂයේ අතිරික්තය ඉහත අගයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආරෝග්‍යශාලා මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආරෝග්‍යශාලා මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

2

ආරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආරෝග්‍යශාලා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇතිබව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති, රෙගුලාසි හා විධිවිධානවලට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය පනතේ 7 වගන්තිය | ආරෝග්‍යශාලා මණ්ඩල පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සීදුවේ පිහිටි ඉඩමේ අයිතිය 2022 මැයි 31 දින වන විටත් ආරෝග්‍යශාලා මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. |

4

| | |
|---|---|
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 හා 2020 පෙබරවාරි 21 දිනැති අංක 01/2020 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛ | බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර අදාළ පාර්ශව වෙතින් අනුමැතිය ලබා ගෙන ඇත්නම් පමණක් අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු නොවන නමුත්, රෝහල් කාර්යමණ්ඩලය සඳහා බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර නොතිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 25 දෙනෙකු ස්ථිර හා අනියම් පදනමින් බඳවාගෙන තිබුණි. |
| (ඇ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබුණු 2006මැයි 10දිනැති අංක 02-84/2006 දරන හා 2001 ඔක්තෝබර් 30 දිනැති අංක 02-117/2001 දරන පොදු චක්‍රලේඛ ලිපි | රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකරනු ලබන පරීක්ෂණ සඳහා නිදර්ශක දීමනා ගෙවිය හැකි නමුත් ඊට අනුකූල නොවන ලෙස හා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත පමණක් සාමාන්‍ය රාජකාරී කාලය තුළ සිදුකර තිබුණු පරීක්ෂණ සඳහා නිලධාරීන් 10 දෙනෙකු වෙත රු.45,550 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ආරෝග්‍යශාලා මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආරෝග්‍යශාලා මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

----------------

(අ) අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2017 දෙසැම්බර් 15 දින ලියාපදිංචි වෛද්‍ය නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. එසේම අනුමත ස්ථිර තනතුරු 04 ක් සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවාගැනීමට කටයුතු නොකර කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ආරෝග්‍යශාලා මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් නමින් නව තනතුරක් ඇති කර එම තනතුර සඳහා 2019 සැප්තැම්බර් මාසයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස 27 කදී දීමනා ලෙස රු.965,000 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති